# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2170/3 - 2020 අප්‍රේල් මස 08 වැනි බදාදා - 2020.04.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ වන මා විසින් (393 වන අධිකාරය වූ) පරීක්ෂණ කොමිෂන් සභා පනතේ 2 වන වගන්තියෙහි විධිවිධාන ප්‍රකාර 2020 ජනවාරි මස 09 වන දින අංක 2157/43 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කෙරුණු නිවේදනයෙන් 2020 ජනවාරි මස 09 වන දින පිහිටුවන ලද "ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියාමනය කරන ලද මූල්‍ය සමාගමක් වන ඊටීඅයි ෆිනෑන්ස් ලිමිටඩ් (ඊටීඅයි) සම්බන්ධව සිදුවිණැයි කියන වැරදි ක්‍රියා, අක්‍රමිකතා සහ අයථා ක්‍රියා පිළිබඳව විමර්ශනය කිරීම, පරීක්ෂා කිරීම සහ වාර්තා කිරීම සඳහා වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ" තත් කාර්යයන් ඉටුකර එහි අවසන් වාර්තාව ඉදිරිපත් කළ යුතු වන්නාවූ 2020 අප්‍රේල් මස 09 වන දිනෙන් අවසන්වන මාස තුනක කාලය, එකී පනතෙහි 4 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, 2020 අප්‍රේල් මස 09 වන දින සිට මාස හයකින්, එනම් 2020 ඔක්තෝබර් මස 09 වන දින දක්වා මෙයින් දීර්ඝ කරමි.

**ගෝඨාභය රාජපක්ෂ,**
ජනාධිපති.

2020 අප්‍රේල් මස 08 වැනි දින,
කොළඹ 01,
ජනාධිපති කාර්යාලයේ දී ය.

1A - G 032215 — 32 (2020/04) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*